පත්වන බවත් එසේම එවැනි ආයතනයක් දේශපාලන සංවිධානයක් මිස කැබිනට් මණ්ඩලයෙන් පිහිටුවා ඇති ආයතනයක් නොවන බවටද ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත.

හිටපු අමාත්‍ය මංගල සමරවීර මහතාගේ සාක්ෂිය නිවැරදි සාක්ෂියක් නොවන බව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති ලිඛිත සාක්ෂි අනුව සනාථ වී ඇත. හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ සාක්ෂියට අනුව සෑම කැබිනට් සන්දේශයක්ම කැබිනට් අමාත්‍යවරුන් අතර බෙදා හැරීමත්, එම කැබිනට් සංදේශය පරිදි කැබිනට් මණ්ඩලය එළඹෙන තීරණය ඊට අදාළ කැබිනට් අමාත්‍යවරුන්, අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තු වෙත දැනුම් දීමත් සිදු කෙරේ. ඒ අනුව දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට අදාළ කැබිනට් සංදේශය සහ කැබිනට් තීරණය අනිකුත් අමාත්‍යවරුන්ට මෙන්ම මංගල සමරවීර අමාත්‍ය අමාත්‍යවරයා ද ලැබිය යුතුවේ.

දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමක් 2015.02.05 වන දින අරලියගහ මන්දිරයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන්ත්යෙන් පවත්වා ඇති අතර එකී රැස්වීමට විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා සහභාගි වී ඇති බව පැ. 42 දරන එකී කමිටු රැස්වීමේ වාර්තාවෙන් සනාථ වී ඇත.

එසේම අරලියගහ මන්දිරයේ 2015.02.23 වන දින පවත්වා ඇති දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමට ද මංගල සමරවීර මහතා සහභාගි වී ඇති බව පැ. 40 දරණ පැමිණීමේ සටහන් පත්‍රයෙන් සනාථ වී ඇත.

හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඔහුගේ සාක්ෂිය දී සඳහන් කළේ කැබිනට් සංදේශය පිළිබඳව මෙන්ම කැබිනට් තීරණය ද ඊට